**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021දෙසැම්බර් 30 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දීවංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හාසිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවේ දේපල පිරියත හා උපකරණවල පිරිවැය රු.13,431,433,930 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව එහි සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එකඟ වෙමු. කෙටුම්පත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර<br>මූලික පියවරක් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ එක්ව ඉඩම්, ගොඩනැගිලි සහ විදුලි සංදේශ කුලුනු සඳහා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට පරිපාලන අංශය විසින් මූලික කටයුතු මේ වන විට ආරම්භ කොට ඇත. | ප්‍රමිතය ප්‍රකාරව වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා රු.42,879,724 ක් වටිනා ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එකඟ වෙමු. කෙටුම්පත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය සඳහා ජාතික විගණන කාර්යාලයේ එකගතාවය ලද වහාම මේ පිළිබඳ කටයුතු කරනු ලබන බව දන්වා සිටිමු. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වත්කම් නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.1,625,000 ක් වටිනා තාක්ෂණික උපකරණ 02 ක් තාක්ෂණික උපකරණ අළුත්වැඩියා හා නඩත්තු ගිණුමට හර කිරීම හේතුවෙන් වර්ෂයේ ශුද්ධ ලාභය හා දේපළ පිරියත හා උපකරණවල අගයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟවෙමු. මෙම වියදම් ස්ථාවර වත්කම්ද නැතහොත් නඩත්තු වියදම්ද යන්න අදාල අංශයෙන් (Network) තහවුරු කර ගැනීමේ ප්‍රමාදයක් හේතුවෙන් නිවැරදි ලෙස වර්ගීකරණය කර නැත. නිවැරදි ගිණුම්කරන පටිපාටිය අනුගමනය කර ඉදිරියේදී නිවැරදි කර පෙන්වන බව දැනුම් දෙමු. | මූල්‍ය ප්‍රකාශනවල වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු කළ අගය මත බදු වගකීම රු.40,424,129 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එය ආරම්භක ශේෂයේ පවතින වෙනසකි. එම වෙනස නිරීක්ෂණය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට කටයුතු කරන්නෙමු. | මූල්‍ය ප්‍රකාශනවල බදු වගකීම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.1,818,166 ක උපචිත වියදම් හා රු.1,530,936 ඉදිරියට කළ ගෙවීම් ගිණුම්ගත කර නොතිබුණ අතර රු.6,010,058 ක ඉකුත් වර්ෂයේ උපචිත වියදමක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | LS Telecom සඳහා 2020 වර්ෂයට අදාලව ගෙවිය යුතු වියදම් එම වසර තුලදීම ගෙවීමට හෝ උපචිත ලෙස සටහන් කිරීමට මූල්‍ය අංශය වෙත සංඛ්‍යාත කළමනාකරණ අංශය වෙතින් තොරතුරු එවා නොතිබිණි. ඒ අනුව වියදම පියවීමට ගිණුම් අංශයට ලැබුන දිනය සලකා ගිණුම්ගත කර ඇත. | වියදම් නිවැරදිව ගිණුම්ගතකළ යුතු වේ. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ආයතන 07 කින් අයවිය යුතු රු.162,004,339 ක ණය ශේෂයක් පැවතියද එක් රාජ්‍ය ආයතනයක ණයහිමි ශේෂය රු.4,257,266 කින් වැඩියෙන් හා තවත් ආයතන 04 ක ණයහිමි ශේෂ නොපැවතුණු බව එම | එකඟ නොවෙමු. ණයගැති ශේෂයන් තහවුරු කිරීම පිළිබද දැනුම්දීමක් සිදුකල ආයතන සඳහා අපගේ අදාල ලිපිගොනුවල නොගෙවූ ඉන්වොයිසි පිළිබඳ සවිස්තරාත්මකව සඳහන්වන අතර, එම ආයතනවලට සිහි කැඳවීමේ ලිපිද වරින් වර යොමු කොට ඇත. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ණයගැති ශේෂ තහවුරු කර ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව සනාථ විය. | | |
| (ඉ) | සන්නිවේදන කුලුනක් වෙනුවෙන් 2019 වර්ෂය හා 2020 වර්ෂය වෙනුවෙන් ලැබුණු රු.252,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා එම ප්‍රමාණයෙන් ලාභය වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය අංශය වෙත සංඛ්‍යාත කළමනාකරණ අංශය වෙතින් තොරතුරු ඒවා නොතිබිණි. ඒ අනුව ගිණුම් අංශයට ලැබුන දිනය සලකා ගිණුම්ගත කර ඇත. | වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | වර්ෂ කිහිපයකට වරක් පමණක් මෙහෙයුම් ක්‍රියාකරුවන්ගෙන් සංඛ්‍යාත පෙර ගාස්තු වෙනුවෙන් අයකර ගනු ලබන රු.3,324,250,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණ ද ආදායම හඳුනා ගැනීමේ පදනම මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කර නොතිබුණි. | එකඟ වෙමු. ඉදිරියේදී මෙම ආදායමේ ස්වභාවය පිළිබඳව වෙනම උපසටහනක් 3.4 Revenue Recognition සටහන යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමු. | මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හඳුනා ගැනීමේ පදනම හෙළිදරව් කළ යුතු වේ. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොතිබීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ණය ගැතියෝ | රු. 360,309,322 | ශේෂ තහවුරු කරගැනීමේ ලිපි | ඔබ විසින් තෝරා එවන ලද ණයගැති සාම්පලයට අදාල සියලු ණයගැතියන් වෙත 2021.12.31 දිනට පැවති ණයගැති ශේෂය තහවුරු කොට ඔබ ආයතනයට සෘජුවම පිළිතුරු එවන ලෙස ඉල්ලා ලියාපදිංචි තැපෑලෙන් ලිපි යොමු කර ඇත. | ගිණුම්වල ඇතුළත් ණයගැති ශේෂ තහවුරු කරගත යුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොකාවිල් කුලුන භාවිතා කරන ක්‍රියාකරුවන්ගෙන් විදුලි බිල්පත් ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු මුදල රු.93,612,539 ක් වූ අතර රාජ්‍ය ආයතන 03 කින් අයවිය යුතු රු.92,656,990 ක ශේෂයක් එයට ඇතුළත් වී තිබුණි. | රාජ්‍ය ආයතන 3 විසින් භාවිතා කරනු ලබන විදුලිබලය සඳහා මාසික ඉන්වොයිසිය මාසිකවම නිකුත් කරන අතර ගෙවීම්වලට අදාල මුල් කාලීන ගෙවීම් කරමින් පවතින අතර තවමත් ආසන්න මාසය දක්වා මුලු මුදල ගෙවීමට කටයුතු කර නොමැත. ඒම මුදල් අයකර ගැනීම සඳහා වර්ථමානය දක්වා කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ණයගැති ශේෂය තුළ පවතින බලපත්‍ර හිමියන්ගෙන් වැඩිපුර අයකර ගන්නා ලද ශේෂවල එකතුව රු.2,178,047 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ශේෂයන් විශ්ලේෂණය කර නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ඇත. | ණයගැති ශේෂ නිවැරදි කර ගත යුතු වේ. |
| (ඇ) | පුද්ගලික ආයතනයකින් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාල ලැබිය යුතු රු.6,358,657 ක විදුලි සංදේශ බදු ආදායම හා ඉකුත් වර්ෂ 03 කට අදාල ආයතන 02 කින් ලැබිය යුතු රු.5,083,244 ක විදුලි සංදේශ බදු අධිභාර මුදල් 2022 ජූනි 06 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | Lanka Cable Satellite Network Ltd. (LCSN) ආයතනය නොගෙවූ රු. 6,358,657 ක් වන විදුලි සංදේශ බදු මුදල අයකර ගැනීමට නීති අංශය මගින් කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට හැකි සෑම පියවරක්ම ගත යුතු වේ. |
| (ඇ) | කොමිෂන් සභාව කුලී පදනමට ලබාගෙන තිබුණු පෞද්ගලික ගොඩනැගිල්ලක් 2015 වර්ෂයේදී භාරදී තිබුණද ඒ සඳහා ගෙවූ රු.1,350,000 ක අත රැඳවුම් මුදල් ආපසු අයකර ගෙන නොතිබුණි. | අදාල ගොඩනැගිල්ලේ මුල් ලිපිගොනුව අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත ලබා දී තිබූ බැවින් එහි විමර්ශන කටයුතු අවසන් වන තුරු මේ පිළිබඳව කටයුතු කිරීමේ හැකියාවක් නොතිබිණි. FCID ඒ පිළිබඳව තවදුරටත් කටයුතු නොකිරීමට තීරණය කර ඇති බව 2022.05.17 දිනැතිව මේ වන විට දන්වා ඇති බැවින් එම අතරැඳවුම් මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට හැකි සෑම පියවරක්ම ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය සඳහා ගෙවා තිබූ සෙස් ගාස්තුවලට අදාළ එකතුකළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල වන රු.3,411,488 ක් සහ 2011 හා 2012 වර්ෂවලට අදාල අයවිය යුතු රු.254,135 ක සෙස් ගාස්තු පුද්ගලික ආයතන දෙකකින් අයකරගත යුතුව තිබුණි. | Lanka Broadband Networks Ltd. ආයතනය 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අදාල සෙස් ගාස්තු ගෙවා ඇති අතර සෙස් ගාස්තු වලට අදාල NBT සහ VAT වශයෙන් රු.3.411.488 ගෙවීමට ඇති බව මුදල් අංශය මගින් LBN සමාගමට 2019.07.09 දිනැති බදු ඉන්වෙයිසිය මගින් ගෙවන ලෙසද අංශය දන්වා ඇති අතර අවශ්‍ය නීතිමය කටයුතු නීති අංශයට මඟින් සිදුකරයි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට හැකි සෑම පියවරක්ම ගත යුතු වේ. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 ඡේදය | | | |
| | | 2021 දෙසැම්බර් 31 දිනට 2011 වර්ෂයේ සිට අයකර ගැනීමට නොහැකි වී තිබූ නිලධාරීන් 04 දෙනෙකුගෙන් මෝටර් රථ ණය රු.395,835 ක් හා ආපදා ණය රු.755,878 ක් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ණය වාරිකයන් පියවන ලෙස එම නිලධාරින්ට හා ඇපකරුවන්ට 2022.04.25 දින නැවතත් දැනුම් දෙන ලදී. ආපදා හා වාහන ණය ලබාදීම පිළිබඳ නව චක්‍රලේඛ නිකුත් කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) | 9.12 ඡේදය | කොමිෂන් සභාවේ ක්‍රියාත්මක වෛද්‍ය රක්ෂණාවරණය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.46,759,745 ක් රක්ෂණ වාරික ගෙවා තිබුණු අතර | 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත)පනතේ 22 (ඇ) (1) වගන්තියේ ප්‍රතිපාදන මගින් බලය ලබා දී ඇති පරිදි කොමිෂන් සභාව විසින් කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය රක්ෂණ ක්‍රමය | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | රක්ෂණ සමාගම විසින් රු.27,262,649 ක් කොමිෂන් සහා නිලධාරීන් වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි. | 1998 වර්ෂයේ සිට කොමිෂන් සභා සේවකයින් හට ලබා දී ඇත. ප්‍රතිපාදන වාර්ෂික අයවැයට ඇතුලත් කර, කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතයි. | |
| (ii) | 9.14.2 ඡේදය | බඳවා ගැනීමේ පරිපාටියට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලබා ගෙන නොතිබුණ අතර කොමිෂන් සභාව අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියකට අනුව කටයුතු කර තිබුණි. | 1996 අංක 27 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතෙහි 22 (ඇ) (2) වගන්තිය මගින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ පරිපාලනයට අදාළ රීති සෑදීම සඳහා කොමිෂන් සභාවට බලය ලබාදී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ඇ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන කාර්ය මණ්ඩලය වෙත දිරි දීමනා, ප්‍රසාද දීමනා, ගෙවල් කුලී දීමනා හා භාවිතයට නොගත් නිවාඩු සඳහා දීමනා ලෙස රු.141,825,830 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතෙහි 22ඇ (1) (ආ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ නීතිපතිතුමාගේ ලිපි මගින් ලබා දී ඇති එකගතාව මත කටයුතු කරමින් ගෙවා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | 2007 ජූනි 01 දිනැති අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය | මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා අනුමත රු.2,000 ක මාසික ප්‍රවාහන දීමනාව ඉක්මවා රු.6,000 ක් බැගින් ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.8,620,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතෙහි 22ඇ (1) (ආ) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ නීතිපතිතුමාගේ ලිපි මගින් ලබා දී ඇති එකගතාව මත මෙම දීමනාව ගෙවා ඇත. | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.32,296,276,914 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.28,028,050,762 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිපලයෙහි රු.4,268,226,152 ක වර්ධනයක් පවතින බව නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ආදායම රු.5,125,078,613 කින් හා විවිධ ආදායම් රු.382,823,667 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

----------------------------------------------------------------------

කොමිෂන් සභාවේ ආදායම හා වියදම පසුගිය වසර හා සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2021.12.31 දිනට | 2020.12.31 දිනට | වෙනස (අඩුවීම / වැඩිවීම) | වෙනසේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ----------- | ----------------- | ----------------- | --------------- | ------------------ |
| | රු. | රු. | රු. | රු. |
| බලපත්‍ර ගාස්තු අදායම | 17,162,602,169 | 12,036,758,914 | 5,125,843,255 | 42.58 |
| විදුලි සංදේශ බදු අදායම | 11,050,897,082 | 10,826,164,612 | 224,732,470 | 2.08 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 3,620,901,150 | 4,292,953,440 | (672,052,290) | (15.65) |
| දුරකථන කෙටි පණිවිඩ සේවා බදු | 399,954,804 | 418,650,656 | (18,695,852) | (4.47) |
| සෙලියුලර් කුලුනු බදු | 1,466,166,667 | 1,426,333,334 | 39,833,333 | 2.79 |
| **මුළු ආදායම** | **33,700,521,871** | **29,000,860,956** | **4,699,660,916** | **16.21** |
| මුළු වියදම | 1,404,244,957 | 972,810,193 | 431,434,764 | 44.35 |
| **වර්ෂයේ බදුපෙර ලාභය** | **32,296,276,915** | **28,028,050,763** | **4,268,226,152** | **15.23** |

(අ) 2020 වර්ෂයට සාපේක්ෂව බලපත්‍ර ගාස්තු ආදායම 2021 වර්ෂයේදී සියයට 43 කින් වැඩිවීමට ප්‍රධාන වශයෙන් වසර කිහිපයකට වරක් පමණක් මෙහෙයුම් ක්‍රියාකරුවන්ගෙන් අයකරනු ලබන සංඛ්‍යාත පෙර ගාස්තු රු.3,324,250,000 ක් 2021 වර්ෂයේ අයකර ගැනීම හා විවිධ ආදායම් පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.382,823,667 කින් හෙවත් සියයට 78 කින් වැඩිවීම බලපා තිබිණි.

(ආ) කොමිෂන් සභාවේ මුළු වියදම රු.749,999,265 න් පරිපාලන හා ආයතන වියදම් සඳහා රු.660,795,995 ක් හෙවත් සියයට 88 ක් වැයකර තිබූ අතර කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.429,324,123 ක් හෙවත් සියයට 65 ක් ඒ තුළ ඇතුළත් වී තිබුණි. එසේ වුවද ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන විදුලි සංදේශ නියාමනය සඳහා මුළු වියදමෙන් රු.50,060,177 ක් හෙවත් සියයට 7 ක් පමණක් වැයකර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හන්තාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි පර්චස් 6.21 ක ඉඩමෙහි අයිතිය පවරා ගැනීම සඳහා 1999 හා 2010 වර්ෂවලදී එහි තක්සේරු වටිනාකම හා වෙනත් වියදම් සඳහා රු.345,502 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණද එහි අයිතිය සමාලෝචිත වර්ෂයේදීද පවරාගෙන නොතිබුණි. ප්‍රධාන කාර්යාලය හා කොකාවිල් බහුකාර්යය මධ්‍යස්ථානය පිහිටි ඉඩම්වල හිමිකම් ඔප්පු හෝ බදු ගිවිසුම් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද ලබාගෙන නොතිබුණි. | හන්තාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයට අදාල ගෙවීම් සිදුකර අවසන් අතර සින්නක්කර ඔප්පුව ලබාදීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගතයුතු බව මහනුවර ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු දන්වා ඇත. අදාල කාර්යය කඩිනමින් සිදු කරන ලෙස දන්වා සිහිකැඳවුම් ලිපියක්ද යවා ඇත. ප්‍රධාන කාර්යාලය හා කොකාවිල් බහුකාර්ය මධ්‍යස්ථානය විශේෂ ප්‍රදානයක් ලෙස පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | වත්කම් වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැට් රහිත වටිනාකම රු.139,882,281 කට පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත්තුවක් 2019 ජනවාරි 31 දින ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලුම් කරන ලද ප්‍රමාන බිල්පත්‍රයෙහි ඇතුළත්ව නොමැති රු.59,374,600 ක් වටිනා විචලතාවයන්ට ගෙවීමට කොමිෂන් සභාවේ අනුමැතිය නොලැබීම නිසා 2020 ජූලි 21 දින සිට ඉදිකිරීම් නතර කර තිබුණි. පසුව 2021 දෙසැම්බර් 14 දිනැති අංක අමප/21/306/094 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මත රු.24,360,085 ක් වූ ප්‍රමාණ බිල්පත්‍රයෙහි ඇතුළත් නොවූ විචලතාවයන් සඳහා 2022 පෙබරවාරි 28 දින | නිරීක්ෂණය නිවැරදි වේ. කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතියේ විචලතාවයන් ඉදිරිපත්කර ඒ පිළිබඳව ව්‍යාපෘති උපදේශකවරුවන්ගේ නිර්දේශද ලැබුණි. කොමිෂන් සභාව විසින් පත්කල ස්වාධීන කමිටුවක් මගින් විමර්ශනයක් සිදුකර විචලතාවයන් පිළිබඳව නිර්දේශ ලබාගැනීමට කටයුතු කරන ලදී. එම නිර්දේශ මත හා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව ගෙවීම් සිදුකර ඇත. | අපේක්ෂිත පරිදි ව්‍යාපෘති නිම කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණද 2019 පෙබරවාරි 13 දින සිට දින 270 ක් තුළ නිම කළ යුතු මෙම ව්‍යාපෘතිය 2022 ජූනි 02 දින වන විටත් අවසන් කර නොතිබුණි. | | |
| (ඇ) | දුරකථන ක්‍රියාකරුවන්ගේ තොරතුරු හා කොමිෂන් සභාවේ ASMS (Antenna Structure Management System) දත්ත අතර කරන ලද සැසඳීම් අනුව කොමිෂන් සභාවේ අනුමැතිය නොලත් කුලුනු සංඛ්‍යාව 941 ක්ද කොමිෂන් සභාව හඳුනා නොගත් කුලුනු 2,778 ක්ද පැවතුණි. | දුරකතන ක්‍රියාකරවන ආයතන විසින් ස්ථාපිත කුළුණු ගණන සහ කොමිෂන් සභාවේ ASMS (Antenna Structure Management System) දත්ත සැසඳීමක් සිදු කරන අතර කොවිඩ් 19 වැනි හේතු කිහිපයක් නිසා ඉලක්කගත ප්‍රගතිය ලබාගැනීමට නොහැකි විය. | සැසඳීම්කර මනා ලෙස කුලුනු පරිපාලනය කළ යුතු වේ. |
| (ඈ) | 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවතින මඩුකන්ද කුලුනෙහි ස්ථාන ගතවී සිටින ක්‍රියාකරුවන් 06 දෙනෙකු සමඟ සේවා ගිවිසුම් හා කොකාවිල් කුලුන භාවිතා කරන රාජ්‍ය ආයතන 03 ක් සමඟ කල්බදු ගිවිසුම්වලට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එළඹ නොතිබුණි. | මඩුකන්ද සම්ප්‍රේෂණ කුලුන භාවිතා කරන සියළුම ක්‍රියාකරුවන් සමඟ ගිවිසුම් ගත වීමට හා රාජ්‍ය ආයතන 3 සමඟ ගිවිසුම්ගත වීමට අදාල ඉදිරි යාමාර්ග පරිපාලන අංශය විසින් නීතී ක්‍රි අංශයේ උපදෙස් මතඅවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | දෙපාර්ශවය අතර නීත්‍යානුකූල බැඳීමක් ඇතිවීම සඳහා ක්‍රියාකරුවන් සමඟ ලිඛිත ගිවිසුම් වලට එළඹිය යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහජන බැංකුවේ අංක 119-1-001-4-3693169 දරන ජංගම ගිණුමට බැරකරන ලද නමුත් 2022 පෙබරවාරි 28 දිනට හඳුනා නොගත් රු.31,586,543 ක ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | එකඟ වෙමු. ඍජු තැන්පතු සඳහා අදාළ මාර්ගෝපදේශ සටහනක් භාෂා තුනෙන්ම ඇතුලත් කරමින් පාරිභෝගිකයන් වෙත ලැබීමට සැලැස් වුවද, එයට අනුගත වීමට අපොහොසත්වන පාරිභෝගිකයින් සිටින අතර රු.31,586,543ක් වූ, මෙම ශේෂය 2022.06.30 දින වන විට, රු.11,068,986.18 ක් දක්වා අඩු වී ඇත. | ජංගම ගිණුම් නිවැරදිව පවත්වා ගෙන යා යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ 2014 ජූලි 28 දින එළඹුණු ගිවිසුම කොමිෂන් සභාව විසින් 2016 අගෝස්තු 10 වන දින අවසන් කර තිබූ අතර එම තීරණයට එරෙහිව ඇස්තමේන්තුගත වන්දිය රු.736,276,907 ක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් බේරුම්කාර මණ්ඩලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත්කර තිබුණි. කොන්ත්‍රාත්තුව නිම කරන දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 33 ක් වූ අතර ඒ සඳහා දරන ලද රු.මිලියන 684 ක් නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කොමිෂන් සභාතීරණයට අනුව ඉදිකිරීම් නතර කල අතර ඉදිරිකටයුතු ආරම්භකිරීම සඳහා පවතින නීති ගැටළු විසදා ගැනීමට නීති අංශය කටයුතු කරගෙන යනු ලබයි. | ආරම්භ කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති ආයතනයට මූල්‍ය පාඩුවක් නොවන පරිදි ක්‍රියාත්මක කල යුතු වේ. . |
| (ආ) | රු.මිලියන 502 ක් වැය කර කොමිෂන් සභාවේ ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2016 අගෝස්තු 24 දින ලබා දී තිබුණු අතර උපදේශන සේවා සැපයීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟ 2014 දෙසැම්බර් 30 දින ගිවිසුම්ගත වී තිබුණි. ගිවිසුම ප්‍රකාරව මුළු උපදේශන සේවා ගාස්තුවෙන් සියයට 70 ක් හෙවත් රු.10,057,910 ක් 2021 දෙසැම්බර් 31 වන විට විශ්වවිද්‍යාලයට ගෙවා තිබූ නමුත් ව්‍යාපෘතිය 2022 අගෝස්තු වන විටත් ආරම්භ කර නොතිබුණි. | ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2014 දෙසැම්බර් 30 දින විශ්ව විද්‍යාලයේ උපදේශන ඒකකය සමඟ සේවා සැපයීම වෙනුවෙන් ගිවිසුම්ගත වී තිබේ. ගෙවීම් කිරීමට අදාල නිරීක්ෂණය නිවැරදි වේ. | ආයතනයට මූල්‍ය පාඩුවක් නොවන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු වේ. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නෙළුම් කුලුන ව්‍යාපෘතිය<br><br>2010 ඔක්තෝබර් 27 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුලුන ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව චීන සමාගම් 02 ක් වෙත ප්‍රදානය කර 2012 ජනවාරි 03 දින කොමිෂන් සභාව මෙම සමාගම් සමඟ ඇ.ඩො. මිලියන 104.3 ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 සිට දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිමකළ යුතුව තිබුණද 2017 ඔක්තෝබර් 31 දින දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා කොමිෂන් සභාව අනුමත කර තිබුණි. මේ සඳහා 2012 සැප්තැම්බර් 17 දින කොමිෂන් සභාව, චීන Exim බැංකුව සමඟ එළඹි ණය ගිවිසුමට අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 85 ක් එනම් ඇ.ඩො. මිලියන 88.655 ක් පමණක් ලබාදීමට එකඟ වී තිබුණ අතර 2016 අගොස්තු 18 දින වන විට ණය මුදල් ලබාගෙන අවසන් කළ යුතු විය. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව නියමිත කාලයට අනුව නිම නොකිරීම නිසා ඇ.ඩො. මිලියන 67.260 ක් එනම් ණය මුදලින් සියයට 76 ක් පමණක් ලබාදී තිබුණි. | | |
| (i) | මුළු ණය මුදල සඳහා රක්ෂණ ගාස්තු, එකඟතා ගාස්තු හා කළමනාකරණ ගාස්තු ගෙවිය යුතු බැවින් ලබා නොගත් ණය මුදලට සමානුපාතිකව ඇ.ඩො. මිලියන 2.9 ක් රක්ෂණ ගාස්තු, එකඟතා ගාස්තු හා කළමනාකරණ ගාස්තු ලෙස ගෙවා තිබුණි. | Exim බැංකුව සමඟ එළඹිගිවිසුමපරිදි එකගතා ගාස්තු, කළමණාකරන ගාස්තු, රක්ෂණ ගාස්තු ගෙවිය යුතුනමුත් එකග වූ ණය මුදලින් භාවිතා කිරිමට නොහැකි වූ කොටස වෙනුවෙන් ගෙවා ඇති ගාස්තු ආපසු ලබාගැනීම පිළිබඳව නීතිපති උපදෙස් ලබා ගෙන ඇත. | ආයතනයට මූල්‍යමය පාඩුවක් නොවන ආකාරයට කොන්ත්‍රාත් කාර්යයන් කළමනාකරණය කරගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතා වාර්තාව අනුව 2015 වර්ෂයේ සිට ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමටත්, එමගින් පලමු වර්ෂ 5 සඳහා වර්ෂයකට රු.මිලියන 1,685 ක ආදායමක්ද දෙවන වර්ෂ 5 සඳහා වර්ෂයකට රු. මිලියන 1,918 ක ආදායමක්ද ඉපැයීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘති කටයුතු ප්‍රමාදවීම මත එම වාර්ෂික ආදායම අහිමි වී තිබුණි. මූල්‍ය ශක්‍යතා වාර්තාව අනුව ඉපැයීමට අපේක්ෂා කළ ආදායම මත ගණනය කළ විට 2021 දෙසැම්බර් 31 දිනට අහිමි වී තිබූ ආදායම<br>රු.මිලියන11,557 ක් විය. | ව්‍යාපෘතිය නියමිත කාලයට නිම කිරීමට නොහැකි වූ බැවින් ශක්‍යතා වාර්තාවට අනුව අදායම් ඉපයීමට නොහැකි වී ඇත. දැනට රාජ්‍ය සමාගමක් ස්ථාපනය කර ආදායම් ඉපයීමේ කටයුතු ආරම්භ කිරිමට සුදානම් කර ඇත. | අපේක්ෂිත පරිදි ඉලක්කගත ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (iii) | මූලික සැලසුම් අනුව ව්‍යාපෘතියේ ආදායමෙන් ණය වාරික ගෙවීමට සැලසුම් කර තිබුණද ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරිම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වනවිට රු.මිලියන 9,900 ක් ණය වාරික හා පොලී වශයෙන් කොමිෂන් සභාවේ මුදලින් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ ඉදිකිරිම් නිමකර ඇති අතර රාජ්‍ය සමාගමක් ස්ථාපනය කර ආදායම් ඉපයීමේ කටයුතු ආරම්භ කිරිමට සුදානම් කර ඇත. | ආයතනයට මූල්‍යමය පාඩුවක් නොවන ආකාරයට කොන්ත්‍රාත් කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (iv) | 2019 සැප්තැම්බර් 16 දින රු.මිලියන 11.3 ක වියදමක් දරා නෙළුම් කුලුන නිල වශයෙන් විවෘත කළද 2022 අගෝස්තු මාසය වන විටත් ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොතිබුණි. | කොමිෂන් සභාවට පවරාගෙන ඇති අතර රාජ්‍ය සමාගමක් ස්ථාපනය කර ආදායම් ඉපයීමේ කටයුතු ආරම්භ කිරිමට අවශ්‍ය මූලික කටයුතු සිදුවෙමින් පවති. | ව්‍යාපාරික කටයුතු ආරම්භ කර ආදායම් ඉපයීමට කඩිනම් පියවර ගත යුතු වේ. |
| (v) | කොමිෂන් සභා තීරණ අනුව නෙළුම් කුලුන වාණිජ්‍යකරණය කිරීමේ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ දරන ලද රක්ෂණ වාරික හා කොන්ත්‍රාත් කාර්යමණ්ඩල දීමනා ලෙස එකතුව රු.මිලියන 56 ක් නෙළුම් කුලුන වාණිජ්‍යකරණය සම්බන්ධයෙන් ස්ථාපිත කරන ලද Colombo Lotus Tower Management Company (Pvt) Ltd සමාගමෙන් අයකර ගැනීමේ පදනම මත ලැබිය යුතු ගිණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කොමිෂන් සභා තීරණ අනුව අයකර ගැනීමේ පදනම මත ලැබිය යුතු ගිණුම් ලෙස මූල්‍ය ප්‍රකාශ වල දක්වා ඇත. | සමාගම ස්ථාපිත කිරීමෙන් පසු දරන ලද වියදම් ආපසු අයකර ගැනීමට ක්‍රියාකල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නෙළුම් කුලුන ව්‍යාපෘතිය සඳහා උපදේශන ගාස්තු ගෙවීම<br>-----------------------------------<br>අංක 10/2473/401/031 හා 2010 ඔක්තෝබර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයපරිදි නෙළුම් කුලුන ඉදිකිරීම සඳහා උපදේශන සේවා ලබාගැනීමට මොරටුව විශ්ව විද්‍යාලය සමඟ අත්සන් කල ගිවිසුම අනුව උපදේශන ගාස්තුව කොන්ත්‍රාත් මුදලින් සියයට 1.5 ක් හෙවත් රු. මිලියන 198.7 ක් ගෙවීමට එකඟ වී එයින් රු.මිලියන 150 ක් මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. අංක 2k15.219.13(ii) හා 2015 නොවැම්බර් 26 දිනැති කොමිෂන් සභා තීරණය මත උපදේශන සේවා ගිවිසුම 2017 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කිරීම නිසා රු.මිලියන 72 ක්ද ගිවිසුම් කාලය අවසාන වීමෙන් පසුව රු.මිලියන 59.8 ක් ද විවෘත කිරීමෙන් පසු නෙළුම් කුලුන කොමිෂන් සභාව වෙත පවරා නොදීම නිසා රු.මිලියන 51.1 ක්ද වශයෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 332.9 ක් උපදේශන ගාස්තු ලෙස මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. ඒ අනුව ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා රු.මිලියන 134.2 ක් ගෙවා තිබුණි. | නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය තුල ඉදිකිරිම නිමකර කොමිෂන් සභාවට භාරදීමට අපොහොසත් වී තිබුණි. තවද කැබිනට් අනුමැතිය ලත් ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් කර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට භාරදෙන තුරු ව්‍යාපෘති ඉංජිනේරු (මොරටුව විශ්ව විද්‍යාලය) කොන්ත්‍රත්තුවේ කාර්යන් සම්පූර්ණ කරවා ගැනීම සඳහා අඛංණ්ඩව සක්‍රියව තබා ගැනීම ව්‍යාපෘති හිමිකරුගේ වගකීම වේ. ඒ අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රත්කරු විටින් විට ලබාදුන් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ ඉලක්කවලට අනුව ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයාගේ කාර්යභාරය ඉටුකිරිමට ලබාදුන් කාලය දීර්ඝ කරන ලදී. මේ වන විට ව්‍යාපෘතිය ඉදිකිරිම් අවසන් වී ඇති නිසා මොරටුව විශ්වවිද්‍යාලයට මාසිකව උපදේශන ගාස්තු තවදුරටත් ගෙවිය යුතු නොවේ. | ආයතනයට මූල්‍යමය පාඩුවක් නොවන ආකාරයට කොන්ත්‍රාත් කාර්යයන් මෙහෙය විය යුතු වේ. |
| (ඇ) | ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 209 ක් වූ කොමිෂන් සභාවේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබූ අතර මොරටුව විශ්වවිද්‍යාලය සමඟ 2019 ජූනි 10 දින එළඹි ගිවිසුම අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීමේ උපදේශන සේවා ගාස්තු ලෙස රු.7,318,256 ක් මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි. ගිවිසුම අනුව 2020 පෙබරවාරි 15 දින වන විට කොන්ත්‍රාත්තුව නිමකර භාරදිමට කටයුතු කර නොතිබූ අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක්ද සිදුකර නොතිබුණි | නිරීක්ෂණය නිවැරදි වේ. | ගිවිසුම්ගත කාලය තුළ කොන්ත්‍රාත්තුව නිම කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------------------- | ------------ |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට කොමිෂන් සභාවේ පුරප්පාඩු 79 ක් වූ අතර අතිරේක/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ හා නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා පුරප්පාඩු 31 ක් එහි ඇතුළත්ව තිබුණි. එසේම නිත්‍ය කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර ද්වීතීයන හා කොන්ත්‍රාත් පදනම මත පිළිවෙලින් නිලධාරීන් 07 දෙනෙකු හා 11 දෙනෙකු 2021 දෙසැම්බර් 31 දින වන විට බඳවා ගෙන තිබුණි. තවද අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන සහකාර ගණකාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා ගෙන වැටුප්, නිවාස කුලී දීමනා, දිරි දීමනා හා ප්‍රවාහන දීමනා ලෙස රු.1,815,699 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | බඳවාගැනීම් පරිපාටි සංශෝධනය කිරීම, සංවිධාන ව්‍යුහය වෙනස් කිරීම, නව සේවක සංඛ්‍යාව සඳහා උපදේශක සේවාව ලබාගැනීමට ගිවිසුම්ගතව ඇති ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සාකච්ඡා කරමින් බඳවාගැනීම් පරිපාටි සංශෝධනය කිරීමට කටයුතු කෙරෙමින් පවතී.<br>කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙන්ම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සැලසුම් කළ පරිදි සාකච්ඡා පැවැත්වීමට නොහැකි වීමත්, කොමිෂන් සභාවේ තාක්ෂණික ස්වරූපයේ තනතුරු වැඩි සංඛ්‍යාවක් අන්තර්ගත වීම නිසා ඒවායේ බඳවා ගැනීමේ සුදුසුකම් හා පැවරෙන රාජකාරි පිළිබඳව ද පුළුල්ව සාකච්ඡා කිරීමට සිදුවීමත් නිසා මේ වන තෙක් බඳවා ගැනීම් පටිපාටි සකස් කර අවසන් කිරීමට නොහැකි වී ඇත. | අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොමිෂන් සභාවේ බඳවාගැනීම් පටිපාටිය සංශෝධනය කිරීම, සංවිධාන ව්‍යුහය, නව සේවක සංඛ්‍යාව, කාර්ය සාධනය ඇගයීම යන කාර්යයන් සඳහා උපදේශන සේවාවන් ලබාගැනීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ රු.2,992,330 ක් වටිනා ගිවිසුමකට 2020 ඔක්තෝබර් 20 දින එළඹ තිබුණි. ගිවිසුම් කාලය දීර්ඝ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එකී කාර්යය නිම කර නොතිබුණු නමුත් එදිනට එම කාර්යය සඳහා රු.1,496,166 ක් ගෙවා තිබුණි. ප්‍රමාද ගාස්තු අයකිරීමේ කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොතිබුණු අතර කාර්යයසාධන සුරක්ෂණයක්ද ලබා නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සමඟ සාකච්ඡා පැවැත්වීමට නොහැකි වීමත් තාක්ෂණික ස්වරූපයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු පිළිබඳ පුළුල්ව සාකච්ඡා කළ බැවින් මෙම කාර්යය නිම කිරීමට නොහැකි විය. එමෙන්ම මේ හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකිරීමටද හැකියාවක් නොමැති බවද නිරීක්ෂණය විය. | ගිවිසුම් ප්‍රකාරව කාර්යය නිමකර කොමිෂන් සභාවට ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. |